**2007 අයවැය කැඳවීම**

**ජාතික අයවැය චක්‍රලේඛ අංක 131**

**ජාතික අයවැය දෙපාර්තමේන්තුව**

**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය**

**2007 අයවැය ලේඛනය සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ හා මගපෙන්වීම**

**2006 ජූලි 27 වනදා**

## සංයුතිය


*අ කොටස*

1. පසුබිම

2. මහින්ද චින්තනය - ඉදිරි දැක්ම
   - 2.1 සමාජ ඒකාවරණය
   - 2.2 ගම නැගුම
   - 2.3 තීරණ ගැනීම විමධ්‍යගත කිරීම
   - 2.4 මහින්ද රන්දොර
   - 2.5 සංවර්ධනයේ කොටස්කරුවෝ
   - 2.6 ශක්තිමත් දේශීය ආර්ථිකයක්
   - 2.7 ආර්ථික ස්ථාවරත්වය

3. ආර්ථික දර්ශනය හා ප්‍රතිපත්තිමය පියවර
4. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය
5. මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුව

*ආ කොටස*

1. අයවැය ප්‍රතිපාදන සඳහා ආංශීය ප්‍රවේශය
2. වියදම් හා සේවක සංඛ්‍යා පිළිබඳව මූලික සීමාවන්
3. ආංශීය ප්‍රමුඛතාවයන්
   - 3.1 දිළිඳුහිතවාදී ආර්ථික වර්ධනය, ජීවනෝපාය හා ප්‍රාදේශීය සංවර්ධනය
   - 3.2 මානව සම්පත් සංවර්ධනය
   - 3.3 යටිතල පහසුකම් සංවර්ධනය
   - 3.4 නිෂ්පාදන, සේවා හා පරිසරය
   - 3.5 විද්‍යාව, තාක්ෂණය, පර්යේෂණ හා සංවර්ධනය
   - 3.6 සමාජ ආරක්ෂණය
   - 3.7 කලාව, සංස්කෘතිය සහ ආගම
   - 3.8 යහ පාලනය, මෙහෙයුම් හා නියාමනය
   - 3.9 මහජන ආරක්ෂාව සහ සාමය

*ඇ කොටස*

**අයවැය සැකසීම පිළිබඳ මාර්ගෝපදේශ**

- මධ්‍යකාලීන වියදම් රාමුව 2007-2009
- වියදම් පුරෝකථනය හා කාර්ය සාධන පිළිබඳ දර්ශකයන්
  - වියදම් පුරෝකථනය
  - මිලදී ගැනීමේ සැලැසුම්
  - කාර්ය සාධන දර්ශකයන්
- ඇස්තමේන්තු සකස් කිරීම
- පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු
- මූලධන වියදම් ඇස්තමේන්තු
- විදේශාධාර මත සංවර්ධන වියදම්
- රාජ්‍ය වියදම් මූල්‍යනය කිරීම
- පවත්නා නිති හා නියාමන ගැටළු
- වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම
- 2007 වර්ෂය තුල පරිපූරක ප්‍රතිපාදන
- පැහැදිලි කිරීම්
- දළ ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

*ඇමුණුම්*

- I. මධ්‍යකාලීන ව්‍යාපෘති විස්තරය 2007 - 2009
- II. මධ්‍යකාලීන කාර්යසාධන නිර්නායක හා පුරෝකථන 2007 - 2009
- III. දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මූලධන සම්පත් බෙදා හැරීම - 2007
- IV. විෂයපථ අනුව මධ්‍යකාලීන මූලධන වියදම් සීමාවන් 2007 - 2009
- V. නව ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ඉල්ලීම්-2007
- VI. දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතින් පිළිබඳ විස්තර-2007
- VII. සේවක සංඛ්‍යා සහ වාහන පිළිබඳ තොරතුරු - 2006
- VIII. සම්මත වියදම් වැඩසටහන්
- IX. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ ආකෘතිය - 2007
- X. ව්‍යවස්ථාපිත ආයතන සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ ආකෘතිය- 2007

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානින්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්

## 2007 අයවැය සහ 2007 - 2009 මධ්‍යකාලීන වියදම් රාමුව පිළියෙල කිරීම පිළිබඳ මාර්ගෝපදේශ

### 'අ' කොටස

*1) පසුබිම*

ජාතික තලයේ නවීන යටිතල පහසුකම් පද්ධතියක් බිහිකරමින්, රට ගැලපෙන ප්‍රාදේශීය හා පළාත් මට්ටමේ යටිතල පහසුකම් පුළුල් කරමින් ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ, අඩු ආදායම් ලාභීන් වෙත සහ සියළු පළාත් අතර බෙදීයාම තහවුරු කිරීමේ අභිප්‍රාය මුල් කොටගත් මහින්ද චින්තන අරමුණු පදනම් කර ගනිමින් 2007 අයවැය ලේඛනය සහ 2007-2009 මධ්‍යකාලීන වියදම් රාමුව සකස් කෙරෙනු ඇත.

ඒ අනුව 2007 අයවැය සහ 2007 - 2009 මධ්‍යකාලීන වියදම් රාමුව පිළියෙල කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇත.

- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ විධිවිධානවලට අනුකූලව 2006 අයවැය සමඟ ප්‍රකාශයට පත් කරන ලද සාර්ව ආර්ථික රාමුවට අනුව වසර 2008 වන විට අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5 ක මට්ටම දක්වා අඩු කිරීම
- කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම සහතික කරනු වස් පොදු අරමුදල් ආංශීය ප්‍රමුඛතා අනුව සකස් කළ යුතු වන අතර එම අංශයන්හි නියෝජනය වන අනෙකුත් ආයතන අතර එකම කාර්යයන් ද්විකරණය වීමට ඇති අවස්ථා වළක්වාලීම.
- රාජ්‍ය වියදම් තුළින් පරිපූර්ණ ප්‍රතිලාභ අත්කිරීම තහවුරු කිරීම පිණිස ආංශීය රාමුව තුළ වැඩසටහන් ක්‍රියාත්මක කරන විවිධ ආයතන අතර පුළුල් සම්බන්ධීකරණයක් ගොඩනැගීම.
- අක්‍රියව පවතින වැඩසටහන් සම්බන්ධයෙන් කල්දැමීමේ හෝ අවසන් කිරීමේ මූලධර්මය අනුගමනය කිරීම.
- ග්‍රාමීය සංවර්ධනය, අධ්‍යාපනය, නිපුණතා සංවර්ධනය, සෞඛ්‍ය, මාර්ග සංවර්ධනය, වාරිමාර්ග, විදුලිය සහ බෙදා හැරීම වැනි හඳුනාගත් උපායමාර්ගික ප්‍රමුඛතාවන් අතර පුළුල් ලෙස මූල්‍යමය සම්පත් බෙදාහැරීම
- රාජ්‍ය ආයෝජනය සියයට 6-8 අතර පවත්වා ගනිමින් සෑම අංශයක්ම නියෝජනය වන පරිදි පෞද්ගලික අංශයේ ආයෝජන පුළුල් කරවීම දිරිගැන්වීම පිණිස රාජ්‍ය ආයෝජනයේ ගුණාත්මක බව වර්ධනය කිරීම. මෙමගින් මධ්‍යකාලීනව සියයට 8 ක පමණ ඉහළ ආර්ථික වර්ධනයක් තහවුරු කිරීම.

*2) "මහින්ද චින්තනය" - ඉදිරි දැක්ම*

මහින්ද චින්තනය - ඉදිරි දැක්ම; රජයේ සංවර්ධන උපායමාර්ගය තුළ මූලික තේමා හතක් පිළිබිඹු වන අයුරින් මධ්‍යකාලීන වියදම් රාමුව නිර්මාණය වනු ඇත.

2.1 සමාජ රැකවරණය

දේශීය ගුණදම් වර්ධනය තුළින් කාන්තාවන්, දරුවන්, වැඩිහිටියන් සහ විවිධ ආබාධිත පුද්ගලයන්ට සහ සමාජයේ වඩාත් පහසුවෙන් පීඩනයට ගොදුරුවන ජනකොටස් සඳහා සමාජ සුරක්ෂිතභාවය සලසාදීම සහ මානව හිමිකම් ගරු කරන යහපාලනයක් ඇති කිරීම.

2.2 <u>ගම නැගුම</u>

දිළිඳු කොටස් ශක්තිමත් කිරීම සඳහා ප්‍රජා මූලික ග්‍රාම සංවර්ධන වැඩසටහන් ඇරඹීම. මේ මගින් ඔවුන් නගා සිටුවීම සඳහා එකී ප්‍රජාව විසින් ම හඳුනා ගනු ලබන අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි පහළ සිට ඉහලට ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා නිසි පියවර ගැනීම. ඔවුනට අදාල සියළු ජීවනෝපායික වැඩසටහන් සහ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් ප්‍රජා සහභාගිත්වය තුලින් ඔවුන්ගේම මග පෙන්වීම යටතේ "ජන සහා " වැඩසටහන් මගින් සිදු කිරීම.

2.3 <u>තීරණ ගැනීම විමධ්‍යගත කිරීම</u>

මහජන අවශ්‍යතා නිසි පරිදි හඳුනා ගනිමින් ඒ සඳහා කාර්යක්ෂම ලෙස සම්පත් බෙදා හැරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් පලාත් පාලන ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් රාජ්‍ය වියදම් කළමනාකරණයේදී අත්‍යාවශ්‍ය වන්නේය. අදාල දිස්ත්‍රික්කයන්හි සමාජ ආර්ථික සංවර්ධනය නංවාලීමේ දී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කාර්යභාර පුළුල් විය යුතු අතර රාජ්‍ය වියදම්වල විනිවිද භාවයද ඉහල මට්ටමක පැවතිය යුතුය. මෙය ප්‍රාදේශීය මට්ටමින් කාර්ය සාධන වර්ධනය කිරීම පිණිස පමණක් නොව විමධ්‍යගත ඒකකයන් හි පරිපාලන නායකත්වය වර්ධනය කිරීමටද හේතු වේ.

2.4 <u>මහින්ද රන්දොර</u>

ජාතික තලයේ යටිතල සංවර්ධන වැඩසටහන් (විදුලිය, මහාමාර්ග, වාරිමාර්ග, ජලසම්පාදනය, වරාය හා ගුවන්තොටුපල, නගර නිර්මාණය හා ආයෝජන කලාප වැනි ) මගින් බිහිවන නවීන යටිතල පහසුකම් පද්ධතියක් හරහා සමස්ථ ආර්ථික සංවර්ධනයකට උරදීමෙන් ආයෝජන අවස්ථා බිහි කිරීම සහ රැකියා උත්පාදනය ඇති කිරීම.

2.5 <u>සංවර්ධනයේ කොටස්කරුවෝ</u>

ආර්ථික සහ සමාජ සංවර්ධනයෙහි ලා රාජ්‍ය හා පෞද්ගලික අංශ සහභාගිත්වය තුලින් වෙළඳපොළ හිතැති, අපනයන දිරිගන්වන, තරඟකාරී ආර්ථික ප්‍රතිපත්තියක් මත එකිනෙකාගේ මනා දායකත්වය තුලින් සිය නිෂ්පාදනයන්ගේ අගය වැඩි කිරීම, රැකිරක්ෂා උත්පාදනය සහ පරිසර ආරක්ෂාව ඇති වන පරිදි ක්‍රියා කිරීම.

2.6 <u>ශක්තිමත් දේශීය ආර්ථිකයක්</u>

දේශීය සම්පත් කාර්යක්ෂම ලෙස යොදා ගනිමින් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොල වෙත භාණ්ඩ හා සේවා උපරිම ලෙස නිෂ්පාදනය කිරීම සහ ආර්ථික වර්ධනය සඳහා ඵලදායී ආකාරයට කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා අංශයන්හි දායකත්වය තිරසාර කිරීම.

2. 7 <u>ආර්ථික ස්ථාවරත්වය</u>

සාර්ව ආර්ථික උපාය මාර්ගයන් මත පදනම් වූ විචක්ෂණශීලී අයවැය සහ මූල්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය මගින් ස්ථාවර ආර්ථික පරිසරයක් තුල ආයෝජන, ඉතිරිකිරීම් වැඩි කිරීම සහ ඉහල ආර්ථික වර්ධනයක් ලඟා කර ගැනීම.

*3) ආර්ථික දර්ශනය සහ ප්‍රතිපත්තිමය පියවර*

පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ උපාය මාර්ග මගින් නැවත යථා තත්වයට පත් වූ ශ්‍රී ලංකාවේ දල දේශීය නිෂ්පාදිතය 2006 පලමු මාස 6 තුල දී සියයට 7.5 වර්ධනයක් පෙන්නුම් කර ඇත. කෘෂිකර්මය, කර්මාන්ත ඉදිකිරීම් සහ සේවා අංශයන් හි උපනතින් පදනම් කර ගෙන 2005 දී සියයට 6.2 ක්ව පැවති වර්ධනයට සාපේක්ෂව ශ්‍රී ලංකා ආර්ථිකය 2006 දී සියයට 7 ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම වර්ධනයට විශාල වශයෙන් හේතු වූයේ තේ, රබර්, නිමි ඇඳුම්, මැණික් සහ ස්වර්ණාභරණ, පිඟන් භාණ්ඩ සහ අනිකුත් කාර්මික භාණ්ඩයන්හි සතුටුදායක අපනයන වර්ධනයත් නව යටිතල පහසුකම් බිහිවීම, වී, පලතුරු, එළවළු, පශු සම්පත් හා ධීවර නිෂ්පාදනවල සතුටුදායක ක්‍රියාකාරිත්වය, සංචාරක කර්මාන්තය, සන්නිවේදන සහ මූල්‍ය සේවාවල ප්‍රගතිය, මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් බොහෝමයක් ව්‍යාප්ත වීමත්ය. විදේශ රැකියා නියුතුවූවන් විසින් එවනු ලබන මුදල් ප්‍රමාණයේ ඉහල යාම රටෙහි නව ආර්ථික ක්‍රියාකාරකම් වැඩිවීමටත්, ඉතිරි කිරීම් වැඩිවීමටත් දායක වී ඇත. පාරිභෝගික ඉල්ලුම දේශීය නිෂ්පාදිත භාණ්ඩ කෙරෙහි යොමු කරවීම තුලින් කෘෂිකාර්මික හා කාර්මික භාණ්ඩ නිෂ්පාදනය සක්‍රීය වශයෙන් පුළුල් කිරීමට දායක වී ඇත.

මෙම සංවර්ධන ප්‍රතිපල 2006 වසරේ ප්‍රථම කාර්තුව තුලදී සේවා වියුක්තිය සියයට 7.2 ට අඩු කිරීමට ඉවහල් විය. මනා ක්‍රියාකාරිත්වයෙන් යුතු අංශයන්හි පවත්නා ශ්‍රම හිඟතාවයන් සැලකිල්ලට ගත් විට මෙම සේවා වියුක්තිය තවදුරටත් අඩු වේ යැයි අපේක්ෂා කළ හැක.

කෙසේ වෙතත් සැලකිය යුතු ලෙස ඉහළ යන තෙල් මිල, ද්‍රව්‍යයන්ගේ මිල ඉහල යාම, වැටුප් සඳහා දරන ඉහළ පිරිවැය මෙන්ම බැංකු ක්‍රමය තුල රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ණය සඳහා වූ ඉල්ලුම සියයට 20 කට වඩා ඉහල යැම හේතු කොට ගෙන 2006 වසරේ දී උද්ධමන පීඩනයකට මුහුණදීමකට සිදුව ඇත. එම නිසා ඉහළ ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා උද්ධමනය අඩු කිරීමට ප්‍රමුඛතාවය දිය යුතුව ඇත. මේ සඳහා දැඩි මූල්‍ය ප්‍රතිපත්තිවලට අමතරව රාජ්‍ය වියදම්වල මනා හසුරුවීමක් ද අත්‍යවශ්‍ය වන්නේය.

අධ්‍යාපන අංශය සම්බන්ධයෙන් ප්‍රාථමික අංශයේ දරුවන් ඇතුලත්වීම සියයට 95 ඉක්ම වුවද, ද්විතීය හා තෘතීය අංශයයන් තුල ළමයින්ගේ ඇතුලත්වීම රඳා පැවැත්ම වර්ධනය කළ යුතුව ඇත. නගරබද අධ්‍යාපන යටිතල පහසුකම් සාමාන්‍ය මට්ටමට වඩා ඉහළින් පැවතුනද, පලාත් හා ග්‍රාමීය මට්ටමේ පාසැල් සඳහා එම පහසුකම් ප්‍රමාණවත් ආකාරයට වැඩි දියුණු කල යුතුය. ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තොරතුරු තාක්ෂණය යන විෂයන් සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යාපන අංශයේ සියළුම ක්ෂේත්‍රයන්හි ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමට ඉහල ප්‍රමුඛතාවයක් දිය යුතුවේ. මධ්‍යකාලීනව ඉහල ආර්ථික වර්ධනයක් පවත්වා ගෙන යාම සඳහා ඉල්ලුම පදනම් කරගත් නිපුණතාවයන් සහ ඉහල මට්ටමේ ශිල්පීය හැකියාවන් බිහි කිරීම අත්‍යාවශ්‍යය.

සෞඛ්‍ය අංශය තුළ දැනටමත් අත්කර ගෙන ඇති අඩු ළදරු සහ මාතෘ මරණ අනුපාතයන්, ඉහළ ආයු අපේක්ෂාවන් සහ සෞඛ්‍ය සේවාවේ දියුණු තත්වයන් තවදුරටත් පවත්වා ගෙන යාම අවශ්‍ය වේ. මේ අතර ළදරුවන්ගේ හා කිරිදෙන මව්වරුන්ගේ පෝෂණ තත්වයන් දියුණු කිරීම, ග්‍රාමීය සෞඛ්‍ය පහසුකම් සීඝ්‍ර ලෙස වැඩි දියුණු කිරීම, රෝගී සත්කාර හා නිවාරණ සේවා ඉහල නැංවීම, අවශ්‍ය ශ්‍රම නිපුණතාවයන් තවදුරටත් පුළුල් කිරීම, උසස් ගුණාත්මක භාවයෙන් යුතු මානව සම්පත් නොදියුණු ප්‍රදේශයන්ට ලබාදීම සෞඛ්‍ය අංශයේ මධ්‍යකාලීන සංවර්ධනය සඳහා අවශ්‍ය වේ. දැනට සෞඛ්‍ය අංශයේ සතුටුදායක සංවර්ධන දර්ශකයන් පවත්වා ගෙන යාම සඳහා දෙනු ලබන වැදගත්කමට සමාන වැදගත් කමක් එම අංශයේ දැනට පවත්නා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට සහ පවත්වා ගෙන යාමට ලබාදිය යුතුය.

මධ්‍යකාලීන ඉහළ ආර්ථික වර්ධනයක් පවත්වා ගෙන යාම සඳහා මාර්ග, විදුලි බලය, ප්‍රවාහනය, වාරිමාර්ග සහ ජල සම්පාදනයට අවශ්‍ය යටිතල පහසුකම් අඛණ්ඩව වැඩි දියුණු කිරීම අවශ්‍යය. ඉහත සඳහන් ක්ෂේත්‍රයන් හි යටිතල පහසුකම් කඩිනමින් සංවර්ධනය කිරීමට රජය බැඳී ඇති අතර, ඒවායේ ඵලදායිතාවය සහතික කිරීම සඳහා විවිධ මූල්‍යකරණ විකල්පයන් සොයා බැලිය යුතුය. මෙය විශේෂයෙන්ම අවශ්‍ය වනුයේ ග්‍රාමීය ප්‍රදේශ සඳහා වර්ෂ 2-3 අතර මධ්‍යකාලීන රාමුවක් තුල යටිතල පහසුකම් සැපයීම පිණිසය. සංචාරක, කෘෂි ව්‍යාපාර, ධීවර, පශු සම්පත්, විදුලි සංදේශ, අලෙවිකරණය, ගබඩාකරණය සහ කර්මාන්ත සංවර්ධන ක්‍රියාකාරකම් සහ වෙනත් සේවා ක්‍රියාකාරකම් සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන වෙනුවෙන් ඉඩ ප්‍රස්ථා සලසාදීම මගින් රේඛීය අමාත්‍යාංශවල සංවර්ධන අරමුණු ජාතික අයවැයට අඩු පිරිවැයක් යටතේ ලඟා කර ගත හැක.

වාණිජමය ක්‍රියාකාරකම්වල නිරතව සිටින රාජ්‍ය ආයතන, වාණිජ ශක්‍යතාවයෙන් යුත් ස්වකීය සංවර්ධන වැඩසටහන් සඳහා අරමුදල් ලබා ගැනීමේදී විකල්ප මූල්‍ය ප්‍රභවයන් හඳුනා ගැනීම ධෛර්යමත් කෙරේ. මෙය හිතකර මූල්‍යමය පරිසරයක් ගොඩනැගීමට සහ ණයමත රඳා පැවතීම අඩු කිරීමටද මගක් වනු ඇත.

දැනට ඌන උපයෝජනයට හෝ ඵලදායී නොවන මට්ටමින් භාවිතා කරනු ලබන ඉඩම්, ගොඩනැඟිලි, රසායනාගාර, පර්යේෂණ ආයතන, සංචාරක නිකේතන, රජයේ ගොවිපලවල් සහ ගබඩා පහසුකම් වැනි වත්කම්වල භාවිතය වැඩිදියුණු කිරීම මගින් ආර්ථික සංවර්ධනය සැලකිය යුතු ලෙස ඉහල දැමිය හැක. රජයේ ආයතන සතු මෙම වත්කම්වල භාවිතය වැඩි කිරීමට පියවර ගැනීම මගින් එම ආයතනවල මෙහෙයුම් වියදම් පියවා ගැනීම සඳහා අවශ්‍ය සම්පත් සපයා ගත හැකිය. මේ මගින් රාජ්‍ය සම්පත් සහ අනෙකුත් වත්කම්වල අපතේ යැම් අඩු කර ගැනීමටද හැකිය.

අපනයන අංශය සියයට 8-10 දක්වා වර්ධනයක් සිදු කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා වැවිලි කෘෂි කර්මාන්තය, පලතුරු සහ එළවළු, නිෂ්පාදන කාර්මාන්ත ද සංචාරක, ධීවර පශු සම්පත් යනාදි අංශයන් හි ඉහළ එකතු කළ

වටිනාකමක් ඇති අපනයන ධෛර්යමත් කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන නිලධාරී වාදය සහ දැඩි පිළිවෙත් අනුගමනය කිරීම අවම කර පහසුකම් සපයන්නකු ලෙස මෙම අංශයන් හි ප්‍රවර්ධන කටයුතු සඳහා සහාය දිය යුතු අතර, විදේශ තානාපති කාර්යාල ඵලදායි ලෙස උපයෝගී කර ගනිමින් විදේශ වෙළඳ පොල සහ ආයෝජන ප්‍රවර්ධනය ඇති කළ යුතුය. මෑත වර්ෂවල ආර්ථික වර්ධනයෙන් ලබාගත් ප්‍රතිලාභ නාගරික ප්‍රදේශයන් කීපයකට පමණක් සීමා විය. මහින්ද චින්තනයෙහි දක්වා ඇති පරිදි ප්‍රාදේශීය අසමානකම් මෙන්ම ආදායම් විෂමතාවයන් අවම කිරීම අවශ්‍ය වේ. රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් කරනු ලබන වැඩසටහන් මහින්ද චින්තනයෙහි හඳුනා ගෙන ඇති නොයෙකුත් පියවරයන් අනුව නැවත සකස් කළ යුතු අතර, ග්‍රාමීය සංවර්ධනයට වැඩි සම්පත් ප්‍රමාණයක් ලැබෙන පරිදි 2007-2009 මධ්‍යකාලීන අයවැය රාමුවෙහි ඒවා ඇතුළත් කරනු ඇත.

ඉහත දර්ශනය පදනම් කර ගෙන අයවැය සාකච්ඡාවෙහිදී පවත්නා ප්‍රතිපත්ති යළි සකස් කිරීමට බලාපොරොත්තු වන අතර එමගින් රේඛීය අමාත්‍යාංශ හා අනෙකුත් කොටස්කරුවන්ගේ ක්‍රියාශීලී සහභාගිත්වයෙන් 2007 වර්ෂයේදී ආර්ථිකය සියයට 7 ඉක්ම වූ වර්ධනයක් ලගා කර ගැනීමට සැලසුම් කෙරේ. ඉහල ඉන්ධන මිල හමුවේ උද්ධමන ඉලක්කය සියයට 8-9 ත් අතර පවත්වා ගෙන යායුතුවේ. මෙම පසුබිම යටතේ මූල්‍ය ප්‍රසාරණය සියයට 16 වන ලෙස පවත්වා ගනිමින් උද්ධමනය සීමා කිරීමටද, තිරසාර ආර්ථික වර්ධනයක් ගොඩනැගීමටද අපේක්ෂා කෙරේ.

## 4) *රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය*

දැනට රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 17.5 ක් වන අතර, පුනරාවර්තන වියදම දළදේශීය නිෂ්පාදිතයෙන් සියයට 19.8 ක් වේ. එමනිසා පුනරාවර්තන වියදම් මධ්‍යස්ථව පවත්වා ගෙන යාම හා රාජ්‍ය ආදායමේ කඩිනම් වර්ධනයක් ඇති කිරීම, මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේලා ප්‍රමුඛතාවයක් ගනු ලැබේ. පොලී ගෙවීම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6 කි. එසේ හෙයින්, පොලී වියදම දැරිය හැකි මට්ටමක පවත්වා ගෙන යාම සඳහා, අවම පිරිවැයට ණය ගැනීමත් සමස්ථ රාජ්‍ය ණය ගැනීම අඩු කිරීමත් අත්‍යවශ්‍යයෙන්ම කළ යුත්තකි.

පුනරාවර්ථන වියදමින් සියයට 35 ක් වැටුප් හා විශ්‍රාම වැටුප් දීමනා වෙනුවෙන් වැය වන හෙයින්, පවත්නා රාජ්‍ය සේවා නියුක්තියේ දායකත්වය උපරිම අයුරින් ලබා ගැනීම, වියදම් පාලනයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සැලකිය යුතුය. මෙයට අමතරව, එවැනි වියදම් පාලනය සඳහා , බඳවා ගැනීමේ හා සේවක සංඛ්‍යා කළමනාකරණය පිළිබඳ කළමනාකරණ සේවා චක්‍රලේඛයට දැඩි ලෙස අනුකූල වීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුත්තකි.

රාජ්‍ය ව්‍යාපාර හා රාජ්‍ය ආයතනයන් හි, මෙහෙයුම් අලාභ පියවා ගැනීම සඳහා ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2 කි. සංවර්ධන කාර්යයන් සඳහා සම්පත් වැඩියෙන් යෙදවීම පිණිස එවැනි අලාභ අවම කිරීම අවශ්‍ය වේ.

සහනාධාර සැපයීම් හා සුභ සාධන වැඩ සටහන්වල පිරිවැය, ඒවා දැරිය හැකි මට්ටම ඉක්මවා ගොස් ඇත. එසේ හෙයින්, එවැනි වියදම් සමාජයේ නියත කණ්ඩායම්වලට පමණක් සීමා කිරීමෙන්, රාජ්‍ය වියදම් හි ඵලදායිතත්වය වැඩි වන අතර, එමගින් රජයේ ඉතුරුම් සමස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි වර්ධනයට ඉවහල් වේ. වාර්ෂික විශ්‍රාම වැටුප් ගෙවීමේ වියදම රු.බිලියන 50 ඉක්මවන අතර එය තවදුරටත් ඉහළ යමින් පවතී. පිරිවැය කාර්යක්ෂම වන ලෙස මෙවැනි විශාල මූල්‍ය ප්‍රවාහයක් පාලනය කිරීමට, මෙම ගෙවීම් ක්‍රමයේ හා කළමනාකරණයෙහි සැලකිය යුතු දියුණුවක් ඇති කළ යුතුව ඇත.

## 5) *මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුව*

මධ්‍යකාලීන සාර්ව ආර්ථික අපේක්ෂාවන් මෙහි 1 වන වගුවෙන් පෙන්නුම් කරන සංඛ්‍යා සටහනින් දැක්වේ. ඒ පිළිබඳව පවතින යෝජනා සහ ඒවාට අදාල ආයතන ඊට ගතයුතු ප්‍රතිපත්තිමය තීරණයන් හා ක්‍රියාමාර්ගයන් පිළබඳ ව අයවැය සාකච්ඡාවේදී සලකා බැලිය හැකිවේ. සංක්ෂිප්තව දක්වන්නේ නම්, මධ්‍යකාලීන වශයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ වාර්ෂික වර්ධන වේගය සියයට 7.0 - 8.5 අතර ප්‍රමාණයකින් 2006 - 2010 දක්වා වන කාලසීමාව තුල අත්කර ගැනීමට සැලසුම් කර ඇත. මෙම වර්ධනය සේවා, නිෂ්පාදන හා කෘෂිකාර්මික අංශයන්ගේ ඵලදායි වර්ධනයක් තුලින් ලබා ගැනීමට අදහස් කෙරේ. ඒ සඳහා 2010 වනවිට කළයුතු සමස්ත ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 33 - 35 අතර විය යුතුය. 2006-2010 අතර කාලය තුළදී රාජ්‍ය අංශයේ ආයෝජන ප්‍රමාණය වත්මන්හි පවතින සියයට

6 සිට 2010 වනවිට සියයට 8 දක්වා ඉහළ යා යුතුය. එසේම පෞද්ගලික ආයෝජන සහ විදේශීය සෘජු ආයෝජන මෙම කාලසීමාවේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 26-28 අතර විය යුතුය.

කෘෂිකාර්මික, වන සංරක්ෂණ හා ධීවර යන අංශ සියයට 3.2 ක ප්‍රමාණයකට වර්ධනය වනු ඇතැයි බලාපොරොත්තු වේ. තේ සහ වී නිෂ්පාදනයන් උපරිම තලයකට ලගාවී ඇති හෙයින්, තවදුරටත් ඒවායෙහි ආන්තික ඵලදායිතාවය සීමිත යයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවත් සේවා නියුක්තියේ හා අපනයනවලින් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන දායකත්වය තුල, එම අංශයන්හි එකතු කල අගයේ වැඩිවීම් තුලින් ප්‍රමාණාත්මක ඵලදායිතා වර්ධනයක් අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වේ. වාසිදායක මිල ගණන් යටතේ රබර් වගාව වෙනුවෙන් වැඩි වන ආයෝජන සමඟ, රබර් නිෂ්පාදනයේ සැලකිය යුතු ප්‍රගතියක් අපේක්ෂා කෙරේ. ආහාර සුරක්ෂිතභාවය පිළිබඳව සහ දේශීය නිෂ්පාදන කෙරෙහි බලපාන සතුටුදායක ප්‍රතිපත්තිමය වතාවරණයක් තුල පලතුරු, එළවළු, පශුසම්පත් හා ධීවර අංශයන් හි තිරසාර වර්ධනයක් ලගා කර ගැනීමට බලාපොරොත්තු වේ.

සැකසුම් කර්මාන්තය, කර්මාන්ත, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ ඉදිකිරීම් යන උප අංශයන්ගේ ඉහළ කාර්ය සාධනයක් සමඟ කර්මාන්ත අංශයේ සියයට 8 ක ආර්ථික වර්ධනයක් අපේක්ෂා කෙරේ.

සංනිවේදන පහසුකම්, ජාත්‍යන්තර වෙළදාම, බහාලුම් මෙහෙයුම්, මූල්‍ය සේවා සංචාරක සහ සම්බන්ධිත සේවාවල ඉහළ කාර්ය සාධනයක් සමඟ, සේවා අංශයේ සියයට 9 -11 ක මධ්‍යකාලීන ඉහළ වර්ධන අනුපාතයක් අපේක්ෂිතය. නිෂ්පාදන හා කෘෂි නිෂ්පාදන සැකසුම් අංශයේ පසු සබඳතා මගින් දේශීය කර්මාන්ත සඳහා ශක්තිය ලබාදෙමින් 2010 වන විට ආර්ථිකයේ සේවා අංශය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 60 කට ලගා වනු ඇත,

විදුලිය, වරාය සහ අනෙතුකත් යටිතල පහසුකම් වර්ධන පුරෝකථනයන්- විදුලිය උත්පාදනය, මාර්ග සංවර්ධනය, ප්‍රවාහනය සහ වරාය පහසුකම් හි අපේක්ෂිත ඉහල අයෝජනයන් හා සැසදේ. එබැවින් යටිතල පහසුකම් සම්පාදනය තුල සැලසුම් කල පරිදි වේගවත් වර්ධනයක් ඇති වෙතැයි අපේක්ෂා කෙරේ.

මෙම සංවර්ධනාත්මක පියවරයන් මගින් රාජ්‍ය ආදායමේ සැලකිය යුතු වර්ධනයක් බලාපොරොත්තු වන අතර එය 2010 දී දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 19 ක් වේ යැයි ගණන් බලා තිබේ. එසේම සමස්ථ අයවැය හිඟය හා ජාතික ණය ප්‍රමාණය දල දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතක් ලෙස ක්‍රමාණුකූලව පහළ බයිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ තත්ත්වය තුල ජාතික ආර්ථිකයෙහි නිෂ්පාදනය සහ ආදායම පිළිබඳ කරනු ලබන පුරෝකථන අනුව රජයේ මූල්‍ය තත්ත්වය සතුටුදායක ලෙස වර්ධනය වීමෙන් වාර්ෂික මිල ඉහළ යාම මධ්‍යකාලීනව සියයට 5 කට වඩා අඩුවෙතැයි බලාපොරොත්තු වේ.

# මහින්ද රන්දොර නව යටිතල පහසුකම්
# සංවර්ධන මූලාරම්භය



‘ආ’ කොටස

*1.අයවැය ප්‍රතිපාදන සඳහා ආංශීය ප්‍රවේශය*

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, වියදම් ආයතන සමඟ සංවාදයකට එළඹීමෙන් අනතුරුව මහින්ද චින්තනයෙහි සමස්ත ප්‍රතිපත්ති රාමුව මත එම ආයතනවලට අදාල අයවැය ප්‍රතිපාදන තීරණය කරනු ඇත. දැනටමත් ආරම්භ කර ඇති මෙම ක්‍රියාවලියේ අරමුණ දස අවුරුදු සංවර්ධන උපාය මාර්ගයන් සකස් කිරීමය. මෙහිදී අදාල පාර්ශවකරුවන් සමඟින් තුන් අවුරුදු සංවර්ධන වැඩසටහන් මූලාරම්භයන් හඳුනා ගනු ලබයි. එය මහින්ද චින්තන අරමුණුවලට අනුකූලව අවශ්‍ය ප්‍රතිසංස්කරණ මත පදනම් වූ දස අවුරුදු සැලැස්මකි.

එකම කාර්යයන් අමාත්‍යාංශ කීපයක් මඟින් සිදු කිරීම වැලැක්වීම සඳහා ඇතැම් අමාත්‍යාංශවලට තවත් අමාත්‍යාංශ කීපයක් සමඟ කටයුතු කර වැඩසටහන් සඳහා මුදල් වෙන් කර ගැනීමත් ඒ සඳහා ක්‍රියා කිරීමේ වගකීමත් පවරනු ලැබේ. එබැවින්, ඉදිරි වසර තුන තුල සංවර්ධන කටයුතු සඳහා අදාල පාර්ශවකරුවන් ගොඩනැගූ ප්‍රතිපත්ති රාමුවට අනුකූල අයවැය ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

2. වියදම් හා සේවක සංඛ්‍යා පිළිබඳව මූලික සීමාවන්

2007 හා ඉදිරි දෙවසර සඳහා වියදම් සකස් කිරීමේ ආරම්භක පියවර ලෙස වැටුප් හා වේතන සඳහා 2006 ඇස්තමේන්තුගත වියදමට සත්‍ය වියදම ගැලපුම් කරනු ඇත. සියළු ආයතනවල දැනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව, සේවක සංඛ්‍යා සීමාව සේ සැලකිය යුතුය. රජයේ ප්‍රමුඛතාවය සහ පවත්නා සම්පත් සීමාව තුල අයවැය සාකච්ඡා අතරවාරයේ සාධාරනීකරණය කළ හැකි කරුණු මත අවශ්‍ය වෙනස් වීම් හඳුනා ගනු ලැබේ.

*3. ආංශීය ප්‍රමුඛතාවයන්*

ආංශීය පදනම මත අයවැය ප්‍රතිපාදන සමාලෝචනය කරනු ලැබේ. මෙම කටයුත්ත පහසු කරවනු වස් සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනිකුත් වියදම් දරන ආයතන පහත සඳහන් අංශයනයට අනුකූලව වර්ගීකරණය කරනු ලැබේ. තමා කරනු ලබන කාර්යයන් මත පදනම්ව සෑම ආයතනයක්ම පහත සඳහන් අංශ එකකට හෝ කිහිපයකට අයත් විය හැක.

3.1 දිළිඳු හිතවාදී ආර්ථික වර්ධනය, ජීවනෝපාය හා ප්‍රාදේශීය සංවර්ධන

තිරසාර ජීවනෝපාය සංවර්ධනය තුලින් ග්‍රාමීය ජනතාවගේ ජීවනතත්වය නඟා සිටුවීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ආදායම් උත්පාදන මාර්ග ප්‍රවර්ධනය කිරීම හා මූලික යටිතල පහසුකම් සපුරාලීම තුලින් එම පරමාර්ථ ඉටුකර ගැනීමට අපේක්ෂා කෙරේ. නව සංවර්ධන කේන්ද්‍ර ඇති කිරීම සඳහා සම්පත් බෙදා හැරීමේදී ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන ඇති පරිදි දරිද්‍රතාවයෙන් ඉහළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 119 සඳහා අවධානය යොමු කරන ලෙසට සියළුම ආයතන වලට උපදෙස් දෙනු ලැබේ. මඟ නැගුම, දහසක් මහවැව්, ගැමිදිරිය, ජනපුබුදුව, ගම්පුබුදුව හා කර්මාන්ත ගම්මාන වැනි ග්‍රාමීය සංවර්ධන මූලාරම්භයන් සඳහා වූ ප්‍රතිපාදන මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 119 ට අවධානයක් යොමු කරමින් වෙන් කරනු ඇත.

*3.2 මානව සම්පත් සංවර්ධනය*

අධ්‍යාපන අංශය සඳහා කරන්නා වූ රාජ්‍ය වියදම්, රජය විසින් සකස් කරනු ලැබ ඇති අධ්‍යාපන ආංශීය සංවර්ධන රාමුව සහ වැඩසටහන මඟින් හඳුනාගෙන ඇති ප්‍රධාන ක්ෂේත්‍රයන් වෙත යොමු කරනු ලැබේ. ඉල්ලුම පදනම් කොටගත් නව උපාධි පාඨමාලා සඳහා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇතුලත් කර ගැනීම අරමුණු කොට ගෙන උසස් අධ්‍යාපන අංශය සඳහා වූ ආයෝජන යොමු කළ යුතුවේ. තරුණ සේවා වියුක්තිය අඩුකිරීම සඳහා ‘ ජීවිතයට

හැකියාවක් - හැකියාවට රැකියාවක් ' යන තේමා පාඨය යටතේ නිපුණතා සංවර්ධන වැඩසටහන් දේශීය සහ විදේශීය ශ්‍රම වෙළඳපොලෙහි ඇති ඉල්ලුමට ගැලපෙන පරිදි තවදුරටත් වැඩිදියුණු කරනු ලැබේ.

සෞඛ්‍ය අංශයේ ප්‍රමුඛත්වය පහසුකම් අඩු ප්‍රදේශ වෙත වැඩි අවධායක් යොමු කිරීමද එහි ගුණාත්මක භාවය සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා ද වේ. තවදුරටත් පිළිකා සහ එච්.අයි.වී/ඒඩ්ස් නිවාරණ වැඩසටහන් වැඩිදියුණු කරමින් බෝවන රෝග තුරන් කිරීමේ අරමුණු ඇතිව රෝග නිවාරණ සේවා ශක්තිමත් කිරීම කෙරෙහි ද අවධානය යොමු කරනු ඇත.

ගැබිනි මව්වරුන් සහ ළමයින් ඉලක්ක කොටගත් ඵලදායී පිරිවැයකින් යුතු පෝෂණ වැඩ සටහන් සඳහා ද ආයෝජනය යොමු කරනු ලැබේ. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල සෞඛ්‍ය අංශයේ පවතින උග්‍ර මානව සම්පත් හිඟය මගහරවා ගැනීම සඳහා වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

දුර්ලභ ගනයේ ආයුර්වේද ඖෂධ සහ පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන්ගේ දැනුම සංරක්ෂණය කිරීම මගින් පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රමයට පිළිගැනීමක් ලබා දෙනු ඇත.

ක්‍රීඩා සංවර්ධනය තුලින් සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහි කිරීමේ මූලික අරමුණ පදනම් කරගත් වැඩසටහන් කෙරෙහි මෙම අංශයේ ආයෝජන යොමු කරනු ඇත. ග්‍රාමීය ප්‍රදේශවල පුහුණු පහසුකම් වැඩිදියුණු කරන අතර 'ක්‍රීඩා ශක්ති' වැඩ සටහන මගින් දක්ෂතාවයන් ඇති ග්‍රාමීය තරුණයින් ජාතික සහ අන්තර් ජාතික මට්ටමට ගෙන එනු ලැබේ.

කම්කරු අංශයේ ආයෝජන වැඩසටහන්, ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය හා සුභසාධනය තහවුරු කරමින් ශ්‍රම ඵලදායීතාවය වැඩිකිරීම, නිපුණතා සංවර්ධනය සහ වඩා හොඳ කම්කරු සබඳතාවයන් ඇති කිරීම සඳහා යොමු කරනු ලැබේ. විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

### 3.3 යටිතල පහසුකම් සංවර්ධනය

අන්තර් ප්‍රාදේශිය සම්බන්ධතාවය ගොඩනැගීමේදී මාර්ග, විදුලිය, ප්‍රවාහන සහ සන්නිවේදන අතිශයින් වැදගත්ය. " මහින්ද රන්දොර " තුලින් පැන නගින් උපරිම සම්බන්ධතාව ලබා ගැනීම සඳහා රටපුරා පැතිර පවතින ප්‍රාදේශිය සංවර්ධන කේන්ද්‍රයන් ප්‍රවර්ධනය කිරීමට අඩු පහසුකම් ඇති ප්‍රදේශවල දියුණු කල යුතු සේවා තත්වයන් හඳුනා ගත යුතුය.

සුනාමියෙන් හානි වූ සහ ගැටුම් පවතින ප්‍රදේශ කඩිනමින් යථා තත්වයට පත්කිරීම පිණිස යටිතල පහසුකම් නැවත ස්ථාපිත කිරීම, පුනරුත්ථාපනය හා ව්‍යාප්ත කරවීම සඳහා ප්‍රමුඛතාවය දිය යුතු යුතුය.

විවිධ ප්‍රජාවන්ගේ අවශ්‍යතාවයන් මත පදනම් කොටගෙන නිවාස හා ඊට අනුබද්ධ අදාල පොදු පහසුකම් තිරණය කළ යුතුය. ප්‍රාදේශීය සංවර්ධනයේ උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියාකරන නගර වල ගුණාත්මක තත්වයෙන් යුත් පොදු පහසුකම් ඇති කළ යුතුය. නාගරික සංවර්ධනය සහ නගර බද ප්‍රදේශවල සංවර්ධන ප්‍රයත්න වෙනුවෙන් අවශ්‍ය වන අරමුදල් සමගාමී ණය, බැඳුම්කර වැනි විවිධ මූල්‍ය ප්‍රභවවලින් සම්පාදනය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

### 3.4 නිෂ්පාදන, සේවා හා පරිසරය

මහින්ද චින්තනයේ මූලික අරමුණ වනුයේ දේශීය සම්පත් මත පදනම් වූ දේශීය කර්මාන්ත දිරිගැන්වීම තුලින් එකතු කල අගය වැඩි නිෂ්පාදන කරා යොමු වීමයි. එම නිසා, දේශීය අමුද්‍රව්‍ය කාර්යක්ෂමව භාවිතා කර ගන්නා මනා විවිධාංගිකරණයකින් යුත් අපනයන ආර්ථිකයක් ඇති කිරීම සඳහා අනුබල දිය යුතු වේ.

පරිසර සංරක්ෂණය ඇති වන පරිදි තිරසාර ලෙස ස්වභාවික සම්පත් කළමනාකරණය කරමින් කෘෂි අංශයේ ආයෝජනයන් වාරි පහසුකම් සහ ඉඩම්, ගුණාත්මක බීජ, ඉහල අස්වනු ප්‍රභේද, පොහොර, නවීන කෘෂි

තාක්ෂණය, ගබඩා පහසුකම්, මූල්‍ය පහසුකම්, උපදේශක සේවා යනාදිය ලබාදීම කෙරෙහි යොමු විය යුතුය. රාජ්‍ය ආයෝජන උපායමාර්ග තුල මහින්ද චින්තනයෙහි දක්වා ඇති සියලු වාරි ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙනු ඇත. තවද ප්‍රතිපාදන ලබාදීමේදී ධීවර හා පශුසම්පත් නිෂ්පාදන අංශයන්හි සංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් හඳුනා ගත යුතුය.

දේශීය කර්මාන්තයේ උන්නතිය සඳහා කර්මාන්ත ප්‍රවර්ධන කලාප ඇති කිරීමට සහ යටිතල පහසුකම් සැපැයීමට ආධාර ලබාදිය යුතුය. මෙහිදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, ඇඟලුම් හා නිම්ඇඳුම්, මැණික් හා ස්වර්ණාභරණ, එළවළු හා පළතුරු සහ සැකසුම් කාර්මාන්ත යන අංශ සංවර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

දේශීය වෙළඳපොළ සුරක්ෂිත කරගනිමින් ද්විපාර්ශ්වීය හා කලාපීය වෙළඳ ගිවිසුම් තුලින් ජාත්‍යන්තර වෙළඳපලෙහි වෙළඳ අවස්ථාවන් පුළුල් කර ගැනීමට කටයුතු කෙරේ.

සංචාරක ප්‍රවර්ධන ක්‍රියාකාරම්කම්වලට අදාල යටිතල පහසුකම් වැඩි දියුණු කරමින්, පාරිසරික හිතකාමී සංචාරකයින් සහ ඉහල ආදායම් මට්ටමක් ඇති සංචාරකයින් ගෙන්වා ගැනීම කෙරෙහි සංචාරක කර්මාන්තයේ විශේෂ අවධානය යොමු විය යුතුයි.

රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි සහභාගිත්වය ඇතිව සංචාරක කලාප සංවර්ධනය කිරීම වැනි මෙම අංශයේ විශේෂ වැඩසටහන් සහ ඒ වැඩසටහන් සඳහා වන මූල්‍ය ප්‍රභවයන් හඳුනා ගත යුතුය.
රටේ තිරසාර සංවර්ධනය ලඟා කර ගැනීම සඳහා පරිසරය ආරක්ෂා කර ගැනීම සහ ජෛව විවිධත්වය ඉතා වැදගත් වේ. මෙහිදී නාගරික අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ගැටළු විසඳීම, නැවත වන වගා කිරීම හා ජල සම්පත් සුරැකීමේ වැඩසටහන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

### 3.5 විද්‍යාව, තාක්ෂණය, පර්යේෂණ හා සංවර්ධනය
රටේ සංවර්ධනය සඳහා නවීන තාක්ෂණ භාවිතයේ ඇති වැදගත්කම අවධාරණය කරනු ලැබේ. දැනට පවතින තාක්ෂණික පහසුකම් තවදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගනිමින් පවතී. ඒ අනුව, දිගුකාලීනව තාක්ෂණය මත පදනම් වූ ආර්ථික සංවර්ධනයට ඉඩ සලසමින්, විද්‍යාව හා තාක්ෂණය, පර්යේෂණ හා නවෝත්පාදන සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් වෙන් කිරීමට අපේක්ෂා කෙරේ.

### 3.6 සමාජ ආරක්ෂණය
ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හා විවිධ හැකියා ඇති ආබාධිත පුද්ගලයන් සඳහා අවශ්‍ය පහසුකම් පුළුල් කරනු ලබන අතර, සම්පත් අවශ්‍යතා හා මූල්‍ය පහසුකම් සලසාදීම සඳහා සමාජ රැකවරණය හා සුභ සාධනය අවශ්‍ය කාන්තාවන්, ළමුන් හා දුප්පත් ජනතාව හඳුනාගත යුතුය.

සමාජීය අවදානම් සම්බන්ධව, විශේෂයෙන් පාසල් සිසුන් සහ පොදු ජනතාව දැනුවත් කිරීම සඳහා විශේෂ වැඩසටහන් හඳුනා ගත යුතු අතර ආපදා සහන සේවා සහ ආවරණ වැඩසටහන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනු ඇත. විශේෂයෙන්ම, කාන්තාවන්, විදේශ ගත ශ්‍රමිකයන්, ළමුන් හා අනෙකුත් අඩු වරප්‍රසාද ලාභී කණ්ඩායම් සඳහා මානව අයිතිවාසිකම් තහවුරු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

### 3.7 කලාව, සංස්කෘතිය සහ ආගම
මෙහි මූලික අරමුණ වන්නේ අපගේ ඉපැරණි කලා හා සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම, වැඩිදියුණු කිරීම හා ප්‍රසිද්ධ කිරීම තුලින් ජන ජීවිතය උසස් මානසික හා අධ්‍යාත්මික ගුණවගාවන්ගෙන් පෝෂණය කිරීමයි. රටේ ආගමික කටයුතු ආරක්ෂා කිරීමෙන් හා ප්‍රවර්ධනය කිරීමෙන් සමාජයේ ආගමික වටිනාකම් වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. සෑම ආගමකටම අයත් සිද්ධස්ථාන කෙරෙහි ජනතාව සමීප කරලීමේ වැඩසටහන් සඳහා සහායදීම තුලින් ආගමික අගයන්ගෙන් පරිපූර්ණ සමාජයක් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

### 3.8 යහපාලනය, මෙහෙයුම් හා නියාමනය

ආර්ථික කටයුතු තුළ රජය පහසුකම් සපයන්නෙකු ලෙස අනුග්‍රහය දැක්වීමේ කාර්යය භාරය ශක්තිමත් කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. එමගින්, රාජ්‍ය සේවාව වඩාත් කාර්යක්ෂම, විනිවිදතාවයෙන් හා වගකීමෙන් යුත්, ජනතා හිතකාමී රාජ්‍ය පාලනයක් බවට පත් කිරීම කෙරෙහි මූලික වශයෙන් අවධාරණය කෙරේ.

රාජ්‍ය සේවයේ අකාර්යක්ෂමතාවය, දූෂණය හා නාස්තිය මුලිනුපුටා දැමීම, තරඟකාරිභාවය වැඩිකිරීම, ගනුදෙනු සිදුකිරීම සඳහා දරන වියදම් අඩුකිරීම හා නීතිරීති හා පිලිවෙත් සරල කිරීම සඳහා විශේෂ අවධානය යොමු කරනු ලබයි. විද්‍යුත් රාජ්‍යපාලනය ශක්තිමත් කිරීමෙන් මහජනතාවට හා මාධ්‍ය ආයතන වලට තොරතුරු සඳහා ලඟාවීමට අවකාශ සැලසීම මධ්‍යකාලීන වියදම් රාමුව තුළ හඳුනා ගෙන ඇත.

රාජ්‍ය සේවා කළමණාකරනයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමටත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම්වරු සවිමත් කිරීමටත්, මහජනතාවගේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාරයක් ලෙස මනා දිස්ත්‍රික් පරිපාලන ක්‍රමයක් ඇති කිරීම සඳහාත් 2007 අයවැය තුල ඉහල ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ. සාර්ව මට්ටමේ මෙන්ම ක්ෂේත්‍ර මට්ටමේ රාජ්‍ය වියදම් අධීක්ෂණය කෙරෙහි අවධානය යොමු කිරීම නව ප්‍රවේශයක් වනු ඇත.

### 3.9 මහජන ආරක්ෂාව හා සාමය

ආරක්ෂිත පරිසරයක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීමට, අපරාධ වලක්වාලීමට හා නීතිය හා සාමය ඇති කිරීමට රජයේ විශේෂ අවධානය යොමු වනු ඇත.

# මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව -2006-2009

| දර්ශකය | ඒකක | | ප්‍රරෝකථනය | | | |
|---|---|---|---|---|---|---|
| | | 2005 (අ) | 2006 | 2007 | 2008 | 2009 |
| මූර්ත අංශය | | | | | | |
| දළ දේශීය නිර්පාදිතය වෙළඳ පොල මිල අනුව | රු.බිලියන | 2,366 | 2,760 | 3,174 | 3,633 | 4,100 |
| ද.දේ.නි.සේ. වර්ධනය | % | 6.0 | 7.0 | 7.5 | 8.0 | 8.5 |
| උද්ධමනය-ද.දේ.නි.අවධමනකය | % | 9.9 | 9.0 | 7.0 | 6.0 | 4.0 |
| දේශීය ඉතිරිකිරීම් | % ද.දේ.නි | 17.2 | 18.5 | 19.8 | 22.5 | 23.8 |
| පුද්ගලික ඉතිරිකිරීම් | % ද.දේ.නි | 19.9 | 20.8 | 19.9 | 20.5 | 20.8 |
| රජයේ ඉතිරිකිරීම් | % ද.දේ.නි | -2.7 | -2.3 | -0.1 | 2.0 | 3.0 |
| මුළු ආයෝජනය | % ද.දේ.නි | 26.5 | 30.0 | 32.0 | 34.0 | 34.8 |
| පෞද්ගලික ආයෝජනය | % ද.දේ.නි | 19.6 | 22.7 | 24.0 | 26.0 | 26.7 |
| රාජ්‍ය අයෝජනය | % ද.දේ.නි | 6.9 | 7.3 | 8.0 | 8.0 | 8.1 |
| විදේශ අංශය | | | | | | |
| භාණ්ඩ වෙළදාම | | | | | | |
| අපනයන | එ.ජ.ඩො.මි | 6,347 | 6,949 | 7,716 | 8,508 | 9,391 |
| වර්ධනය | % වෙනස | 10.2 | 9.5 | 11.0 | 10.3 | 10.4 |
| ආනයනය | එ.ජ.ඩො.මි | 8,863 | 10,417 | 11,901 | 13,088 | 14,406 |
| වර්ධනය | % වෙනස | 10.8 | 17.5 | 14.2 | 10.0 | 10.1 |
| වෙළඳ පරතරය | එ.ජ.ඩො.මි | -2,516 | -3,467 | -4,185 | -4,580 | -5,014 |
| සේවා වෙළදාම | | | | | | |
| ශුද්ධ සේවා | එ.ජ.ඩො.මි | 338 | 406 | 571 | 781 | 973 |
| ලැබීම් | එ.ජ.ඩො.මි | 1,540 | 1,755 | 2,085 | 2,440 | 2,800 |
| ගෙවීම් | එ.ජ.ඩො.මි | 1,202 | 1,349 | 1,513 | 1,659 | 1,827 |
| පුද්ගලික සංක්‍රාම (දළ) | එ.ජ.ඩො.මි | 1967.5 | 2,361 | 2,727 | 3,040 | 3,363 |
| වර්ධනය | | 25.8 | 20.0 | 15.5 | 11.5 | 10.6 |
| ජංගම ගිණුම | එ.ජ.ඩො.මි | -652 | -1,158 | -1,292 | -1,228 | -1,184 |
| ජංගම ගිණුම් අතිරික්තය | % ද.දේ.නි | -2.8 | -4.3 | -4.4 | -3.7 | -3.2 |
| ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම | එ.ජ.ඩො.මි | 1225.9 | 1,484 | 1,783 | 1,522 | 1,685 |
| රාජ්‍ය ලැබීම් | එ.ජ.ඩො.මි | 971.4 | 1,199 | 1,542 | 1,473 | 1,517 |
| ප්‍රදානයන් | එ.ජ.ඩො.මි | 223.8 | 135 | 338 | 251 | 226 |
| ණය ආධාර | එ.ජ.ඩො.මි | 747.6 | 1,065 | 1,205 | 1,222 | 1,291 |
| සහනාදායි ණය | එ.ජ.ඩො.මි | 630.6 | 815 | 1,005 | 1,022 | 1,091 |
| සහනදායි නොවන ණය | එ.ජ.ඩො.මි | 117.0 | 250 | 200 | 200 | 200 |
| සමස්ත ශේෂය | එ.ජ.ඩො.මි | 501.5 | 325.3 | 490.5 | 294.2 | 500.4 |
| සමස්ත පොලිය | % ද.දේ.නි | 2.1 | 1.2 | 1.7 | 0.9 | 1.4 |
| දේශීය සංචිත (ආ. නිෂ් ස්ව. හැරුණු කොට | එ.ජ.ඩො.මි | 2,458 | 2,629 | 3,115 | 3,393 | 3,872 |
| විදේශ නිල සංචිත | | | | | | |
| ආනයන මාස | මාසය | 3.3 | 3.0 | 3.1 | 3.1 | 3.2 |
| ණය සේවා කරණ අනුපාතය (ආ) | % | 8.0 | 11.7 | 9.6 | 9.8 | 8.9 |
| මුළු විදේශ ණය | % ද.දේ.නි | 48.3 | 45.9 | 43.0 | 40.8 | 38.9 |
| රාජ්‍ය මූල්‍ය අංශය (ඇ) | | | | | | |
| ආදායම | % ද.දේ.නි | 16.1 | 17.2 | 17.9 | 18.5 | 18.7 |
| වියදම | % ද.දේ.නි | 24.7 | 26.3 | 25.4 | 24.0 | 23.7 |
| ආදායම් (හිගය/අතිරික්තය) | % ද.දේ.නි | -2.7 | -2.3 | -0.1 | 2.0 | 3.0 |
| සමස්ත අයවැය හිඟය | % ද.දේ.නි | -8.7 | -9.1 | -7.5 | -5.6 | -5.5 |
| දේශීය මූල්‍යනය | % ද.දේ.නි | 5.2 | 5.7 | 4.6 | 3.2 | 2.8 |
| රාජ්‍ය ණය | % ද.දේ.නි | 93.9 | 90.5 | 86.9 | 82.4 | 78.0 |
| විදේශ ණය | % ද.දේ.නි | 40.4 | 38.2 | 36.5 | 34.9 | 33.1 |
| දේශීය ණය | % ද.දේ.නි | 53.5 | 52.2 | 50.4 | 47.5 | 44.9 |
| මූල්‍ය අංශය (ඈ) | | | | | | |
| සංචිත මුදල් වර්ධනය | % | 15.8 | 16.0 | 15.0 | 14.5 | 13.0 |
| පුළුල් මුදල් වර්ධනය (එම් 2බී) | % | 19.1 | 16.5 | 15.5 | 15.0 | 13.5 |
| පටු මුදල් වර්ධනය (එම් 1) | % | 22.4 | 13.0 | 13.5 | 13.0 | 11.5 |
| රජයේ සංස්ථාවන්ට දුන් ණය වර්ධනය | රු.බිලියන | 24.5 | 6.0 | -4.8 | -2.0 | -1.5 |
| පෞද්ගලික අංශයට දුන් ණය වර්ධනය | රු.බිලියන | 136.7 | 141.1 | 155.4 | 179.6 | 162.6 |
| පෞද්ගලික අංශයට දුන් ණය වර්ධනය | % | 21.5 | 18.3 | 17.0 | 16.7 | 13.0 |

(අ) තාවකාලික

(ආ රාජ්‍ය ණය සේවා කරන ගෙවීම්, වෙළඳභාණ්ඩ හා සේවා අපනයන ආදායමේ ප්‍රතිශතයක් ලෙස

(ඇ) සුනාමි වියම් ඇතුලත්ව

(ඈ) වර්ෂ අවසාන වටිනාකමෙහි ලක්ෂමය වර්ධනය

සටහන ණය සහනයන් රාජ්‍ය මූල්‍ය තත්තයන්ගේ අන්තර්ගතය

‘ඇ’ කොටස

*අයවැය සැකසීම පිළිබඳ මාර්ගෝපදේශ*

**මධ්‍යකාලීන වියදම් රාමුව 2007 - 2009**

රජය මධ්‍යකාලීන වියදම් රාමුවක් තුල විචක්ෂන මූල්‍ය කලමනාකාරීත්වයක් සහ කාර්යක්ෂම සම්පත් සැලසුම්කරණයක් කෙරෙහි අවධාරණය යොමු කරනු ඇත. අවම පිරිවැය ක්‍රම භාවිතා කරමින් වඩා කාර්යක්ෂම හා ජනහිතකාමී රාජ්‍ය අංශයක් ඇති කිරීමෙහිලා, සිදු කරනු ලබන නව මූලාරම්භයන් යෝජනා කරනමෙන් ඔබගෙන් ඉල්ලා සිටිනු ලැබේ. පවත්නා සීමිත අරමුදල් තත්වය සලකා විකල්ප මූල්‍ය ප්‍රභව හඳුනා ගනිමින් ව්‍යාපෘති හා වැඩසටහන් ප්‍රමුඛතා ලේඛනයන් පිළියෙල කිරීම අවශ්‍ය වේ. මුදල් වියදම් කරනු ලබන ආයතන තුන් අවුරුදු රාමුවක් තුල වර්තන හා මූලධන වියදම් දෙවර්ගයම කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර එම අදාල යෝජනා ඇමුණුම් හි දැක්වෙන ආකෘතින් භාවිතා කරමින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුවේ.

**වියදම් පුරෝකතන හා කාර්ය සාධන පිළිබඳ දර්ශකයන්**

වියදම් පුරෝකතන හා කාර්ය සාධන ඉලක්ක සැකසීමේදී පහත දැක්වෙන කරුනු කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතුවේ.

- **වියදම් පුරෝකතන**

2007 - 2009 යන වසර සඳහා භාණ්ඩාගාරය විසින් උද්ධමන ගැලපීම් සිදු කරනු ලබන **සැපයුම් හා සේවා සැලසුම්** හෙයින් උද්ධමනය පිළිබඳ සැලකිලිමත් වීම අවශ්‍ය නොවේ. ප්‍රතිලාභ සඳහා හිමිකම් ඇති පුද්ගලයින්ගේ සංඛ්‍යාවෙහි ඇස්තමේන්තුගත අඩු හෝ වැඩිවීම සම්බන්ධයෙන් හිමිකම් වැඩසටහන්(විශ්‍රාම වැටුප්, පාසැල් නිල ඇඳුම් යනාදිය) සම්බන්ධයෙන් වියදම් දරනු ලබන ආයතන විසින් වියදම් සඳහා අවශ්‍ය ගැලපීම් කලයුතු වේ. අයවැය අවශ්‍යතාවයන් සාධාරණීකරනය කිරීම පිණිස එවැනි එක් එක් අංශවල වැඩිවීම තහවුරු කිරීමට ප්‍රතිලාභීන්ගේ නියම සංඛ්‍යාව ඉදිරිපත් කළ යුතු වේ. භාණ්ඩාගාරය විසින් සුදුසු පරිදි සාමුහික ප්‍රතිපාදන වෙන් කරන හෙයින් වියදම් දරණ ආයතන විසින් වැටුප් සංශෝධන පිළිබඳ වූ ස්වකීය මධ්‍යකාලීන පුරෝකතනයන් සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන් කළ යුතු නොවේ.

- **මිලදී ගැනීමේ සැලසුම්**

සැපයුම් හා සේවා සඳහා වූ සියලුම ඇස්තමේන්තු ජාතික සැපයුම් ආයතනය විසින් දක්වා ඇති යෝජිත මිලදී ගැනීමේ සැලසුම් පිළිබඳ උපදේශයන්ට අනුකුල විය යුතුවේ. විධිමත්ව සකස් කළ සැපයුම් හා සේවා සැලසුම් නොමැති නම් ඒ සඳහා ප්‍රතිපාදන ඇතුලත් නොකල යුතුය. අයවැය සඳහා වූ වියදම් පිරිවැයකරණය මැනවින් සකස් කරන ලද මිලදී ගැනීම් සැලසුම්මත පදනම් විය යුතුය.

- **කාර්ය සාධන දර්ශකයන්**

ස්වකීය ප්‍රධාන කාර්යයන් හා අරමුණුවලට නිසි අවධානය යොමු කරමින් දිගුකාලීන ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් වලට අනුකුලවන පරිදි අමාත්‍යාංශවල ක්‍රියාකාරී සැලසුම් සැකසිය යුතුවේ. ව්‍යාපෘති යනු මෙහෙවරයන් ළඟා කර ගැනීමේ මාධ්‍යයන් වේ. මෙම ව්‍යාපෘතීන්ගේ අරමුණු පැහැදිලි සහ මැනිය හැකි විය යුතුය. කාර්ය සාධන නිර්නායක සෑම ව්‍යාපෘතියකම අරමුණු හා ඉලක්ක නියෝජනය වන ආකාරයේ විය යුතුය. සෑම අංශයක්ම පැහැදිලි ප්‍රථිඵල තුලින් ආර්ථිකයට දායක වනු ඇත. එබැවින් වියදම් දරන ආයතන විසින් මෙහි ඇමුණුම II දෙන ලද ආකෘති පත්‍රය අනුව 2007 වසරේ හා මධ්‍යකාලීන නිශ්චිත ප්‍රතිඵල පදනම් කරගත් නිර්නායක ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ඇස්තමේන්තු සකස් කිරීම**

හිඟ සම්පත් ඉහල ප්‍රමුඛත්වයක් හිමි වියයුතු අංශ සඳහා තාර්කිකව යොමු කිරීමේත් රාජ්‍ය වියදම්වල කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේත් අරමුණ ඇතිව විචක්ෂණ මූල්‍ය කළමනාකරණය තුලින් රාජ්‍ය වියදම් වඩාත් අර්ථාන්විතව වැය කරන බව තහවුරු වන පරිදි, ස්වකීය ආයතනවල අයවැය සකස් කිරීමේදී සියලුම ආයතන ප්‍රධානින්ගේ පෞද්ගලික මැදිහත් වීම අපේක්ෂා කෙරේ.

මෙම චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශ අනුව, චක්‍රලේඛයට අමුණා ඇති අදාල ආකෘති පත්‍ර භාවිතා කරමින් තම අමාත්‍යාංශය යටතට වැටෙන සියළුම ආයතන ද ඇතුලත්ව වර්ෂ 2007,2008 සහ 2009 සඳහා යථාර්තවාදි ආකාරයේ වියදම් පුරෝකථනය ද සහිතව 2007 වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කරන ලෙස සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.
එසේ වුවද, මහින්ද චින්තන ප්‍රතිපත්තින්හි ඇතුලත් ඉහල ප්‍රමුඛතාවයන් ඇති කාර්යයන් සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් කර නොමැති බව මහා භාණ්ඩාගාරය විසින් නිරීක්ෂණය කරනු ලැබුවහොත්, අයවැය ඇස්තමේන්තු අවසන් වශයෙන් තීරණය කිරීමට පෙරාතුව ලේකම්වරුන් සමඟ පවත්වන සාකච්ඡා වලදී, අදාල ලේකම් වරුන්ගේ එකඟත්වයද ඇතිව අදාල අංශයේ වියදම් සීමාව ඇතුලත එකී කාර්යයන්ට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම පිණිස අදාල ඇස්තමේන්තු නැවත සකස් කරනු ලැබේ.

**පුනරාවර්ථන වියදම් ඇස්තමේන්තු**

i. පුනරාවර්ථන වියදම් සඳහා ඇස්තමේන්තු සැකසීමේදී 2007 වර්ෂයේ මෙහෙයුම් කාර්යයන් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට ප්‍රථමයෙන් 2006 වර්ෂයේ ප්‍රතිපාදන වලින් පියවීමට නොහැකි නිසා 2007 වර්ෂයේදී ගෙවීමට සිදුවන යම් වගකීම් (හිඟහිටි ගෙවීම් ) හෝ මූල්‍යමය බැඳීම් ඇතොත් ඒවා සඳහා ප්‍රතිපාදන වෙන්කර ගතයුතුය.
ii. උපයෝගිතා සේවා සහ සැපයුම් සේවා සඳහා වන වියදම් දැරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කළයුතුය.
iii. ඒ ඒ ආයතන විසින් තම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම මගින් ස්වකීය සංවිධානය තුල යම් යම් වියදම් අඩුකරලීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ. උදා :- අරපිරිමැසුම් දායක විදුලි පරිභෝජනයක් සඳහා වන වියදම් සියයට 10 කින් අඩුකර ගැනීම.
iv. පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී වියදම් පාලනය සඳහා දැනට පවත්නා චක්‍රලේඛවලදී විධිවිධාන අදාල කර ගත යුතුය.

**මූලධන වියදම් ඇස්තමේන්තු**

රජයේ වියදම් විශ්ලේෂණයන් මගින් තහවුරු කරන පරිදි බෝහෝ ආයතන, ඒවාට වෙන් කරන ලද මූලධන ප්‍රතිපාදන විශේෂයෙන් විදේශාධාර ව්‍යාපෘති සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් සැලකිය යුතු ප්‍රමාණයක් උපයෝජනය කරගෙන නැත. ඒ අනුව හිඟ සම්පත් වඩාත් කාර්යක්ෂම අයුරින් ප්‍රමුඛ සංවර්ධන ව්‍යාපෘතින් අතර බෙදා වෙන්කර ලීමට මහා භාණ්ඩාගාරයට සිදුවී තිබේ. ඒ අනුව නව සංවර්ධන මූලාරම්භයන් ඉටු කරනු ලබන සියළු ආයතන මූලධන වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය.

අ) ප්‍රමුඛතාවය තීරණය කිරීම පහත සඳහන් අනුපිළිවෙලට කළ යුතුය.

(i). අයවැයෙහි වසර 05 ක් පමණ කාලයක් තිස්සේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති කඩිනමින් සම්පූර්ණ කිරීම හෝ නැවත සකස් කිරීම.
(ii) අවශ්‍යතාවය පිළිබඳ නිසි ඇගැයීමක් නොමැතිව කෙරෙන නව වත්කම් ඉදිකිරීම් වෙනුවට පවත්නා වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.

(ආ) නව වියදම් ආරම්භයේදී පහත පියවරයන් අනුගමනය කර තිබේදැයි තහවුරු කර ගත යුතුවේ.
- ඒ ඒ සංවර්ධන ව්‍යාපෘතින්හි ආර්ථික යෝග්‍යතාවය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙතින් නිර්දේශ කර ගැනීම.
- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබීම.

- සියලුම විදේශාධාර ව්‍යාපෘති සඳහා විදේශ අරමුදල් තිබෙන බවට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් තහවුරු කරගෙන තිබීම.
- එකම කාර්යයන් හා ක්‍රියාකාරකම් ද්විත්වකරණය සඳහා අන්තර් අමාත්‍යාංශ මට්ටමින් ස්වකීය කාර්යයන් හා ක්‍රියා කාරකම් සම්බන්ධයෙන් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතු අතර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙතින් එය සනාථ කර ගත යුතුය.
- පළාත් සභාවලට පවරා දෙනු ලැබූ කාර්යයන් සම්බන්ධයෙන්ද මෙම තත්වය අදාල කර ගැනීමෙන් සමාන කාර්යයන් සඳහා පළාත් සභා සහ මධ්‍යම රජයේ ආයතන විසින් අනුග්‍රාහක කාර්ය භාරයක් ඉටු කල යුතුය.

**විදේශ ආධාර මත සංවර්ධන වියදම්**

විදේශාධාර ණය සහ ප්‍රදාන මගින් සහාය ලබන දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සහ වැඩසටහන්වල මුළු වටිනාකම එක්සත් ජනපද ඩොලර් මිලියන 4400 ක් වේ. සාමාන්‍යයෙන් කාර්යක්ෂම උපයෝජන මට්ටම අත්පත් කර ගැනීමට නම් යටත් පිරිසෙයින් එක්සත් ජනපද ඩොලර් මිලියන 1200 -1500 ත් අතර ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගත යුතුය. මීට අමතරව ගිවිසුම් අත්සන් කර ඇති කල්ගතවන ක්‍රමවේද නිසා එහෙත් කාර්යන් මෙතෙක් අරඹා නැති ව්‍යාපෘති හා වැඩසටහන් ගණනාවක් ඇත. මේ අතරතුර නව ව්‍යාපෘති සහ වැඩසටහන් ගණනාවක් දැනට හඳුනා ගනිමින් පවතී.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කරන පොදු කරුණු වශයෙන් සඳහන් කරනුයේ දේශීය අරමුදල්වල ඌණතාවය, ටෙන්ඩර් පටිපාටියේ ප්‍රමාදය, කොන්ත්‍රාත්කරුවන්ගේ ධාරිතාවේ සීමාවන්, පිරිවැය ඉහල යාම, ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය සහ අවශ්‍ය පහසුකම් සපයා ගැනීමේ දුර්වලතා, කම්කරු හා පාරිසරික ප්‍රශ්න, දුර්වල ව්‍යාපෘති කළමනාකරණය සහ අධීක්ෂණය, අදාල නීති සම්පාදනය කර ගැනීමේ ප්‍රමාදයන්ය.

මෙවැනි ව්‍යාපෘතිවල නියැලී සිටින ආයතන විසින් නව ව්‍යාපෘති ඇරඹීමට ප්‍රථමයෙන් මෙම ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති වල කටයුතු කඩිනම් කළ යුතු වේ. මීට අමතරව 2007 අයවැය මගින් සුදුසු විකල්ප යෝජනා කිරීම සඳහා අපේක්ෂිත මට්ටමින් ක්‍රියාත්මක නොවන සියලු ව්‍යාපෘති වෙනම ලේඛණගත කල යුතුය.

**රාජ්‍ය වියදම් මූල්‍යනය කිරීම**

දැනට රජයේ මුළු පුනරාවර්තන වියදම පියවීම සඳහා රජයේ ආදායම ප්‍රමාණවත් නොවේ. සමස්ථ සංවර්ධන වියදම් දේශීය හා විදේශීය ණය ගැනීම් මගින් මූල්‍යනය කෙරේ. එමනිසා මනා රාජ්‍ය ණය කළමනාකරණයක අවශ්‍යතාවය මතුවී තිබේ. එමනිසා රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමට සෑම උත්සායක්ම ගන්නා අතර පුරාවර්තන වියදමේ අඩුකිරීමක් තුලින් විදේශාධාර ප්‍රමාණවත් ලෙස ලබා ගැනීම මගින් රාජ්‍ය ආයෝජන කටයුතු සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් වෙන් කිරීමෙන් ආර්ථික වර්ධනය අත්පත් කර ගැනීමත් එමගින් රජයේ ණය බර අඩු කර ගැනීමත් අපේක්ෂා කරයි. ඒ අනුව වියදම් දරණ සියලු ආයතන විසින් විවිධ මූල්‍ය ප්‍රභවවලින් සහාය ලබන වියදම් වැඩසටහන්වල ඵලදායීතාවය පිළිබඳව අවධාරණය කළ යුතුය.

**පවත්නා නීති හා නියාමන ගැටළු**

නොයෙක් විදේශාධාර ව්‍යාපෘති යටතේ කල යුතු බවට හඳුනා ගත් විවිධ ව්‍යවස්ථාමය වෙනස් වීම් විවිධ හේතු නිසා තවදුරටත් අවධානය යොමු නොවී පවතී. සෑම අමාත්‍යාංශයක් හා ආයතනයක් මගින් මෙවැනි අවශ්‍යතාවයන් එහි වර්තමාන තත්වය යෝජිත ක්‍රියාකාරී සැලැස්ම සමඟ හඳුනා ගත යුතුය. මෙවැනි ව්‍යවස්ථාමය මූලාරම්භයන් 2007 අයවැයෙහි පැහැදිලිව ලැයිස්තුගත කළ යුතුය.

***වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම***

ඇස්තමේන්තු සකස් කිරීම කඩිනම් කිරීම පිණිස මෙම චක්‍රලේඛනයේ ඇ කොටසේ ඇමුණුම් ලෙස දක්වා ඇති ආකෘති, www.treasury.gov.lk වෙබ් අඩවියෙහි ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ Microsoft Excel Worksheets ලෙස “ ජාතික අයවැය චක්‍රලේඛණයේ ඇමුණුම් ” (Annexures to National Budget Circular) යනුවෙන් සපයා ඇත. මෙම ඇමුණුම් Excel worksheet ලෙස බාගත කිරීම (download) හෝ මුද්‍රිත පිටපත් ලෙස ලබා ගැනීමට පුළුවන. මෙම ඇමුණුම් මෘදු පිටපත් ලෙස (ව්‍යුහාත්මක වෙනස්කම් සිදු නොකර) සම්පූර්ණ කර 3 1/2 නම්‍ය තැටි (3 1/2 floppy) මගින් එවිය යුතුය. ඒ සමඟම නිසිලෙස අත්සන තබන ලද ලිඛිත පිටපත්ද ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

වගුව 2 - ඇමුණුම් ලේඛණය

| ඇමුණුම | විස්තරය |
|---|---|
| ඇමුණුම I | මධ්‍යකාලීන ව්‍යාපෘති විස්තරය 2007-2009 |
| ඇමුණුම II | මධ්‍යකාලීන කාර්යසාධන නිර්නායක හා පුරෝකථන 2007-2009 |
| ඇමුණුම III | දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මූලධන සම්පත් බෙදීයාම -2007 |
| ඇමුණුම IV | විෂය පථ අනුව මධ්‍යකාලීන මූලධන සීමාවන් 2007-2009 |
| ඇමුණුම V | නව ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ඉල්ලීම් - 2007 |
| ඇමුණුම VI | දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතීන් පිළිබඳ විස්තර - 2007 |
| ඇමුණුම VII | සේවක සංඛ්‍යාව සහ වාහන පිළිබඳ තොරතුරු |
| ඇමුණුම VIII | සම්මත වියදම් වැඩසටහන් |
| ඇමුණුම IX | අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ ආකෘතිය - 2007 |
| ඇමුණුම X | ව්‍යවස්ථාපිත ආයතන සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ ආකෘතිය - 2007 |

***2007 වර්ෂය තුල පරිපූරක ප්‍රතිපාදන***

අමාත්‍යාංශ විසින් ප්‍රබල හේතු දැක්වීමක් නොමැතිව ඉදිරිපත් කරනු ලබන පරිපූරක ඇස්තමේන්තු හා මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම සඳහා වන කිසිදු ඉල්ලීමක් මහා භාණ්ඩාගාරය විසින් සලකා බලනු නොලැබේ. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පූර්ව එකඟතාවය නොමැතිව අතිරේක ප්‍රතිපාදන සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් නොකරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. එමනිසා 2007 වසරේ කෙටුම්පත් අයවැය ඇස්තමේන්තු යථාර්තවාදී
ආකාරයෙන් සකස් කිරීම ලේකම්වරුන්ගේ වගකීම වනු ඇත.

***පැහැදිලි කිරීම්***

මෙම චක්‍රලේඛනයේ සඳහන් කරුණු පිළිබඳව වැඩිදුර පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් ඔබගේ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ව්‍යවස්ථාපිත මණ්ඩලය/ව්‍යාපෘතීන් හෝ අදාල අංශ පිළිබඳව ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙහි කටයුතු කරන නිලධාරීන්ගෙන් විමසිය හැක. මණ්ඩලය, ව්‍යාපෘතීන් සහ අදාල අංශ පිළිබඳව කටයුතු කරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් විමසිය හැක.

**දළ ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

කෙටුම්පත් ඇස්තමේන්තු සහ අනෙකුත් අදාල තොරතුරු 2006 අගෝස්තු මස 11 වෙනි දිනට ප්‍රථම ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. අයවැය ඇස්තමේන්තු විමර්ශනය සඳහා පැවැත්වෙන රැස්වීම් අදාල විෂය පථයන්ට අනුව 2006 අගෝස්තු 25 වන දින සිට සැප්තැම්බර් මස 08 වන දින දක්වා පැවැත්වේ.

## වගුව 3 - අපේක්ෂිත අයවැය දින දර්ශනය

| | කාර්ය විස්තරය | ඉලක්ක ගත දිනයන් |
|---|---|---|
| 1 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති කමිටුව විසින් මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුව සකස් කිරීම සහ ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම | 2006 ජූලි 31 |
| 2 | 2007 අයවැය සහ ප්‍රමුඛතා පිළිබඳ සංක්ෂිප්ත සටහන අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම. | 2006 අගෝස්තු 10 |
| 3 | රේඛීය අමාත්‍යාංශ විසින් අයවැය ප්‍රතිපාදනවලට අදාල ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය | 2006 අගොස්තු 11 |
| 4 | වියදම් දරණ ආයතන සමග ආංශීය පදනමක් යටතේ අයවැය ඉල්ලීම් සමාලෝචනය කිරීම | 2006 අගෝ: 25 සිට සැප්: 08 දක්වා |
| 5 | විසර්ජන පනත , කෙටුම්පත් කර අවසන් කිරීම (වැඩසටහන් අනුව වියදම් සාරාංශ) | 2006 සැප්: 22 |
| 6 | විසර්ජන කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම | 2006 සැප්: 27 |
| 7 | විසර්ජන කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | 2006 ඔක්: 05 |
| 8 | අයවැය කථාව | 2006 නොවැ. 09 |
| 9 | වියදම් දැරීමට බලය ලබාදීම (ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍රය අත්සන් කිරීම) | 2006 දෙසැම්බර් 27 |
| 10 | භාණ්ඩාගාරය විසින් 2007 වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ නිකුත් කිරීම | 2007 දෙසැම්බර් 28 |

**අ.ක/ පී.බී. ජයසුන්දර**

භාණ්ඩාගාරයේ ලේකම්,

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

පිටපත්: 01. විගණකාධිපති,

02. සභාපතිවරු/රාජ්‍යසංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල

03. ව්‍යාපෘති අධ්‍යක්ෂවරු

ඇමුණුම 1(අ)

# මධ්‍යකාලීන ව්‍යාපෘති විස්තරය 2007– 2009

| විෂය පථය හා අංශය | දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති | අමාත්‍යාංශය |
|---|---|---|
| **දිළිඳු හිතවාදී ආර්ථික වර්ධනය , ජීවනෝපාය හා ප්‍රාදේශීය සංවර්ධනය** | | |
| | ජන පුබුදුව, ගැමි පුබුදුව | සමෘද්ධි හා දිළිඳුකම පිටුදැකීමේ |
| | දහසක් කර්මාන්ත ගම්මාන දියුණු කිරීමේ වැඩසටහන (ගුරුපැහැයෙන් රන් පැහැයට ) | ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන |
| | දහසක් මහවැව් | ගොවිජන සේවා හා ගොවිජනතාව නඟා සිටුවීමේ |
| | ගම නැගුම, ගැමි දිරිය | ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන |
| | කිරි ගම්මාන | වතු යටිතල පහසුකම් හා පශු සම්පත් |
| | කාන්තා දිරිය | පේෂකර්මාන්ත සංවර්ධන |
| | ඔසු ගම්මාන | දේශීය වෛද්‍ය |
| | විසිරි නිවස | යටිතල පහසුකම් සංවර්ධන හා ධීවර නිවාස |
| | ජන සෙවන | නිවාස හා ඉදිකිරීම් |
